**මහ කොළඹ අප ජලය කළමනාකරණ ව්‍යාපෘතිය - 2018**

**-----------------------------------------------------------------**

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2009 දෙසැම්බර් 18 දින එළඹී අංක 2557 දරන ණය ගිවිසුමේ 5 වන උපලේඛනයේ 27 වන වගන්තිය සහ අංක 2528 දරන ණය ගිවිසුමේ 5 වන උපලේඛනයේ 27 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුම් වලට අනුව අභ්‍යන්තර සහ ස්වදේශ කටයුතු සහ පළාත් සභා, පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කොළඹ මහනගර සභාව සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. සාගර හා මිරිදිය ජලයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ සනීපාරක්ෂාව සහ සනීපරික්ෂාව තත්ත්වය වැඩිදියුණු කිරීම තුළින් මහ කොළඹ ප්‍රදේශයේ නාගරික හා උප නාගරික වැසියන්ගේ නාගරික පරිසරය සහ මහජන සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම්වලට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,597.11 කට සමාන එජඩො මිලියන 110.24 ක් වන අතර ඉන් රු.මිලියන 10,783.63 කට සමාන එජඩො මිලියන 94.37 ක් ආසියානු සංවර්ධන බැංකුව මඟින් මූල්‍යයනය කිරීමට එකඟවී තිබූ අතර ඉතිරි මුදල වන රු.මිලියන 1,813.46 ක් ශ්‍රී ලංකා රජය මඟින් මූල්‍යනය කිරීම සඳහා අපේක්ෂා කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 අප්‍රේල් 09 දින ආරම්භ කර තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දින 2020 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | ගිණුම්කරණ අඩුපාඩුව | මුදල රු.මිලියන | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය විසින් ඉදිකර 2016 අප්‍රේල් 26 දින කොළඹ මහ නගර සභාවට භාරදෙන ලද රසායනාගාර ගොඩනැගිල්ල මූල්‍ය ප්‍රකාශනවල සංවර්ධන පිරිවැය යටතේ අඛණ්ඩව දක්වා තිබුණි. | 5.61 | මූල්‍ය ප්‍රකාශන වැරදි ලෙස පෙන්වීම | අවසන් කරන ලද වැඩවල පිරිවැය සංවර්ධන පිරිවැයෙන් වෙන්කිරීමට පියවර ගත යුතුය. | ව්‍යාපෘතිය විසින් ඉදිකරන ලද වත්කම් සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වෙත මාරු කිරීම සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තිය තීරණය කිරීම අවශ්‍ය වේ. ඉදිකිරීම් වැඩ නිම කරන ලද වත්කම්වල පිරිවැය අදාල වත්කම් ගිණුමට මාරු කළ යුතුය. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට විදේශ විනිමය ලාභය ජංගම නොවන වත්කම්වල පිරිවැයට එරෙහිව හිලව් කර තිබුණි. | 25.22 | ජංගම නොවන වත්කම් අඩුවෙන් දැක්වීම | අදහස් දක්වා නොමැත. | ජංගම නොවන වත්කම් වල නියම වටිනාකම ගිණුම්වලට ගත යුතුය. |

### 2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 6 (01) (අ) වගන්තිය | පිරිවැය රු.මිලියන 5 හෝ ඊට වැඩි කොන්ත්‍රාත් පිළිගත් කොන්ත්‍රාත්කරුවන් විසින් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි | නීතිමය සහ බදු සම්බන්ධ ගැටළු මත කොන්ත්‍රාත්කරුවන්ට එරෙහිව පියවර ගැනීමට නොහැකි වේ. | නීතිමය අවශ්‍යතාවන් සමඟ අනුකූලවීමට කොන්ත්‍රාත්කරුවන්ට දැනුම්දීමට පියවර ගෙන තිබුණි. | මෙම අවශ්‍යතාවන් සමඟ අනුකූලවීමට කොන්ත්‍රාත්කරුවන්ට පෙළඹවීමට පියවර ගැනීමට අවශ්‍ය වේ. |

විය යුතු අතර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසු දින 60 ක් ඇතුළත කොන්ත්‍රාත් ගිවිසුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කළ යුතුය. කෙසේ වෙතත්, සිවිල් ඉදිකිරීම් සහ සැපයුම් කොන්ත්‍රාත්කරුවන් මෙම අවශ්‍යතාවයන්ට අනුකූල වී නොතිබුණි.

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

මහ කොළඹ ප්‍රදේශයේ මිරිදිය ජලයේ සනීපාරක්ෂාව සහ සනීපාරක්ෂක තත්ත්වය වැඩිදියුණු කිරීමේ අරමුණු සඳහා මලාපවහන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ආයතනික සහ මෙහෙයුම් ධාරිතාවය ශක්තිමත් කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණය සහ ආයතනික සහය යනාදි ප්‍රධාන සංරචක 03 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කර තිබුණි. ගුරුත්වාකර්ෂණ මාර්ගවල කිලෝමීටර් 10 ක ගුරුත්වාකර්ෂණ අපවහන පුනරුත්ථාපනය යටතේ කටයුතු සහ කිලෝමීටර් 125 ක අපජල නාලිකා වල තත්ත්ව පරීක්ෂාවක් සිදු කිරීමේ භෞතික ප්‍රගතිය 2018 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත ඉලක්කවලට පිටු පසින් පැවතුණි. වරාය නගරය සංවර්ධනය, කොළඹ මධ්‍යම ව්‍යාපාරික දිස්ත්‍රික්ක, ජල සම්පාදන කටයුතු වැනි කොළඹ නගරයේ මෑත කාලීන සංවර්ධනයන් හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු වල විෂය පථය වෙනස් කිරීමට අවශ්‍ය විය. එහි ප්‍රතිඵලයක් ලෙස පොල්වත්ත සහ බොරැල්ල පොම්පාගාර යටතේ කටයුතු වල විෂය පථය වෙනස් කර තිබුණු අතර අමතර කටයුතු හඳුන්වා දෙන ලදි. එම නිසා පිරිවැය සහ එම කටයුතු අවසන් කිරීම සඳහා ගත වන කාලය පිළිබඳ බලපෑම විගණනයේදී තීරණය කළ නොහැකි විය.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) පෞද්ගලික පදිංචිකරුවන්ට සිදුවූ පාඩු හේතුවෙන් 2013 දෙසැම්බර් 20 දින පුද්ගලික සමාගමකට පිරිනමන ලද වනාතමුල්ල අපවහන පුනරුත්ථාපන කටයුතු සම්බන්ධ කොන්ත්‍රාත්තුව 2017 අප්‍රේල් 05 දින අවසන් කර තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් විධිමත් පාරිසරික අධ්‍යයනයක් සිදුකර හෝ ආරක්ෂිත ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු | (අ) කොන්ත්‍රාත්තුව නැවත ප්‍රසම්පාදනයේ අමතර පිරිවැය දැරීම සහ ඒ මත වන්දි ගෙවීමට සිදුවීම.<br>(ආ) සැලසුම් කළ කටයුතු වල නිම කිරීම්වල ප්‍රමාදයන්<br>(ඇ) අපේක්ෂිත පහසුකම් ප්‍රතිලාභීන් වෙත ලඟා නොවීම. | කොන්ත්‍රාත්තුව අවසන් කිරීම හේතුවෙන් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ඉතිරි කටයුතු නිම කිරීමට අඛණ්ඩ උත්සාහයක් සිදුකර ඇත. සියළුම උත්සහයක් අසාර්ථකවීම හේතුවෙන් ක්‍රියාත්මක වන කොන්ත්‍රාත්තුවක් | ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමේ ප්‍රමාදයන් සහ අමතර පිරිවැය ඇතිවීම වැලැක්වීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කොන්ත්‍රාත්කරුවන්ගේ කටයුතු පිළිබඳව මනා නියාමනයක් සහ අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීමට අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| බව නිරීක්ෂණය විය. තවද එම දේපල අනවසර වූ අතර රක්ෂණාවරණය යටතේ වන්දි ලබාගැනීමට නොහැකි බවත් අනාවරණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට රු.මිලියන 1.92 ක් ගෙවීමට සිදුවිය. තවද, ඉතිරි කටයුතු නිම කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීමට 2018 දෙසැම්බර් 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි. | | සංශෝධනය කිරීමට සහ අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතුවල ඉතිරි කොටස වෙනත් කොන්ත්‍රාත්කරුවකුට ප්‍රදානය කිරීමට පියවර ගෙන තිබුණි. | |
| (ආ) සිදුකරන ලද භෞතික කටයුතු වල මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් කොළඹ මහ නගර සභාවේ අප ජල පොම්පාගාරය සැලසුම් කිරීම, ඉදිකිරීම, ස්ථාපනය කිරීම සහ පුනරුත්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව යටතේ 2015 ජූලි 30 දින කරන ලද රු.මිලියන 1,177.86 ක වැඩ අත්තිකාරම අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | කොන්ත්‍රාත් මුදලින් සියයට 90 ක් ගෙවීමට පෙර අත්තිකාරම් මුදල අයකර ගැනීමේ අවධානමක් පවතී. | කොන්ත්‍රාත් මිලෙන් සියයට 90 ගෙවීමට පෙර අත්තිකාරම් මුදල අයකර ගැනීමේ ප්‍රතිපාදන මෙම කොන්ත්‍රාත්තුව තුළ නොමැත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව අත්තිකාරම් ගෙවීම් අන්තර් ගෙවීම් වලින් අයකර ගැනීමට අවශ්‍ය වේ. |

### 3.3 නිෂ්කාර්ය සම්පත්

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2019 මාර්තු මස මාදම්පිටිය ව්‍යාපෘති පාරිසරික රසායනාගාරයේ සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී රසායනාගාර ද්‍රව්‍ය තොගයක් වර්ෂ 2 ක් පුරා භාවිතයට නොගෙන පැවතුණු බව අනාවරණය විය. | රසායනාගාර උපකරණ අවභාවිතයක් සිදුවිය හැකි අතර ණය මුදල් ඵලරහිතව භාවිතය සිදුවේ. | කොළඹ මහ නගර සභාව විසින් ඔවුන්ගේ පරීක්ෂා කිරීමේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන කරන ලද ඉල්ලීම් මත තොග අයිතමයන් නිකුත් කර ඇත. | තොග අයිතමයන් ඉල්ලීම සහ අතිරික්තව තබා ගැනීමේ හේතු විමර්ෂණයට පියවර ගැනීම අවශ්‍ය වේ. |

### 3.4 පාරිසරික කරුණු සම්බන්ධ ගැටළු

| විගණන ගැටළු | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|
| 2018 ඔක්තෝබර් 22 දින සිට බලපැවැත්වෙන පරිදි | ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව පාරිසරක තක්සේරු | පරිසර නියාමන අවශ්‍යතාවය සමඟ අනුකූල වීම සහතික කිරීම සඳහා | ව්‍යාපෘතියේ කටයුතු පරිසරයට සංවේදී බැවින් |

| | | | |
|---|---|---|---|
| ව්‍යාපෘතියේ පරිසර නිලධාරියා ඉවත්ව තිබුණි. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ පාරිසරික කාර්ය සාධනය නිරන්තරයෙන් නියාමනය කළ යුතු අතර ඒ පිළිබඳ වාර්තා ණය නියෝජිතායතනය වෙත අර්ධ වාර්ෂිකව ඉදිරිපත් කළ යුතුය. | නිරන්තරයෙන් සිදුකිරීමට නොහැකි වේ. | තාවකාලික විධිවිධාන යොදා ඇත. පුරප්පාඩුව පිරවීම සඳහා දැනටමත් පියවර ගෙන ඇත. | මෙම අවශ්‍යතාවය අනිවාර්ය වේ. එම නිසා පරිසර නිලධාරියකු බඳවා ගැනීම සඳහා කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |

**3.5 මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටළු**

| කාර්ය මණ්ඩල තනතුරු | 2018 දෙසැම්බර් 31 දිනට කාර්ය තනතුරු සංඛ්‍යාව | | | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | අනුමත | තථ්‍ය | පුරප්පාඩු සංඛ්‍යාව | | | |
| නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක (ඉංජිනේරු) | 1 | - | 1 | ව්‍යාපෘතියේ කටයුතුවල සුමට ක්‍රියාකාරිත්වයට බලපානු ඇත. | පවතින ඉහළ වෙළඳපොල මිල හේතුවෙන් සුදුසුකම් සහිත පුද්ගලයින් රඳවා ගැනීමට අපහසු වේ. අයදුම්පත් කැඳවීමට සහ සුදුසුකම්ලත් පුද්ගලයින් බඳවා ගැනීමට පියවර ගෙන ඇත. | සුදුසු පුද්ගලයි යෙදවීම සඳ කඩිනම් පියව ගැනීම අවශ්‍ය වේ |
| ව්‍යාපෘති ඉංජිනේරු (ප්‍රසම්පාදන) | 1 | - | 1 | | | |
| ව්‍යාපෘති ඉංජිනේරු | 10 | 08 | 02 | | | |
| සහකාර ව්‍යාපෘති ඉංජිනේරු II | 05 | 03 | 02 | | | |
| ඉදිකිරීම් කළමනාකරු I | 02 | 01 | 01 | | | |